**ලංකා රාජ්‍ය ජාලය සඳහා නව පරිගණක එක් කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු**

1. දැනට පවතින පරිගණක ලංකා රාජ්‍ය ජාලය හා සම්බන්ධ වීමේදී එම පරිගණකවල මෙහෙයුම් පද්ධතිය සහ භාවිතා වන සියලුම මෘදුකාංග බලපත්‍ර සහිත නීතිමය ඒවා විය යුතුය. දැනට බලපත්‍ර රහිත මෘදුකාංග මත මෙම පරිගණක ක්‍රියාත්මක වේ නම් ඒවාට බලපත්‍ර සහිත මෘදුකාංග ස්ථාපනය කළ යුතුය. එසේ නොමැති නම් නොමිළයේ ලබාගත හැකි නිදහස් හා විවෘත මෘදුකාංග මේ සඳහා භාවිතා කල හැකිය.

2. එමෙන්ම මෙසේ පවතින පරිගණක ලංකා රාජ්‍ය ජාලය හා සම්බන්ධ කිරීමේදී අවශ්‍ය වන ප්‍රති වෛරස මෘදුකාංග, රාජ්‍ය ජාලයේ උපකාරක සේවය අමතා අනුමත මුදලකට ලබා ගත හැකි බව සලකන්න. නැතහොත් නිරතුරුව යාවත්කාලීන කළ හැකි ප්‍රති වෛරස මෘදුකාංග වෙනත් ආයතනයකින් ඔබට මිලදී ගත හැක. (නිදහස් හා විවෘත මෘදුකාංග භාවිතා වන්නේ නම් ප්‍රති වෛරස මෘදුකාංග ස්ථාපනය කිරීමට අවශ්‍ය නොවේ)

3. ලංකා රාජ්‍ය ජාල ව්‍යාපෘතිය යටතේ නොවන අලුතින් යෝජිත පරිගණක පද්ධතිය හා පවතින පරිගණක උපාංග නඩත්තු කටයුතු සඳහා එම ජාලගත කිරීම් කරන ලද සහ පවතින පරිගණක සපයා දී ඇති ආයතන සමග සේවා ගිවිසුම් වලට එළඹිය යුතුය. මෙයට හේතුව ලංකා රාජ්‍ය ජාලයෙන් බැහැරව පවතින පරිගණක වල ඇතිවන දෝෂ සඳහා ලංකා රාජ්‍ය ජාලයේ උපකාරක සේවය මගින් සේවා නොසැපයෙන බැවිනි.

පරිගණක සඳහා බලපත්‍ර සහිත මෘදුකාංග ස්ථාපිත කිරීමට නොහැකි නම් ඒ වෙනුවට නොමිළයේ ලබා ගත හැකි නිදහස් හා විවෘත මෘදුකාංග භාවිතා කල හැකිය. එසේ භාවිතා කල හැකි මෘදුකාංග කිහිපයක් පහත දැක්වේ.

| මෘදුකාංග වර්ගය | භාවිතා කල හැකි විකල්ප විවෘත මෘදුකාංග |
|---|---|
| මෙහෙයුම් පද්ධති (Operating System) | • Ubuntu<br>• Kubuntu<br>• Fedora |
| කාර්යාලීය කටයුතු සඳහා වන මෘදුකාංග (Office Packages) | • Open Office |
| ග්‍රැෆික් මෘදුකාංග (Graphic Softwares) | • GIMP |
| ඉ-මේල් මෘදුකාංග (E-mail Client Software) | • Mozilla Thunder Bird |
| වෙබ් පිටු නිර්මාණය (Web Designing) | • KompoZer |